දේවානම්පියතිස්ස රජුගේ මරණයෙන් පසු, ඔහුගේ බාල සොහොයුරු උත්තිය කුමරු රජ විය. උත්තිය රජුට පසු මහාසිව නම් සොහොයුරෙක් ද, ඉන් පසු සූරතිස්ස නම් තවත් සොයොයුරෙක් ද සිහසුනට පත් විය.

සූරතිස්ස රජුගේ පාලන කාලයේ දී, ලංකාව සමග අශ්ව වෙළඳාමෙහි යෙදී සිටියකුගේ පුතුන් දෙදෙනකු වූ සේන හා ගුත්තික යන දෙමළ සොහොයුරෝ ලංකාව ආක්‍රමණය කොට රජු පරදා රාජ්‍ය පැහැර ගත්හ. මේ දෙදෙන අවුරුදු විසි ගණනක් රාජ්‍ය කොට ඇත. ඉන්පසු ඔවුන් පරාජය කොට පලවා හැර බලයට පත්වුණේ අසේල නම් රජෙකි. අසේල රජුගේ කාලයේ, එළාර නම් බලවත් සොලී පාලකයෙක් ලංකාව ආක්‍රමණය කොට, අසේල රජු පරදා, රාජ්‍යය පැහැර ගෙන අනුරාධපුරයේ රජ කළේය. මේ එළාර රජ, මිතුරාටත් සතුරාටත් එක සේ සාධාරණය ඉටු කළ යහපත් පාලකයෙකු බව සඳහන් වේ.

ක්‍රි. පූ. පළමු වන ශතවර්ෂය පමණ වන විට, ලංකාව ප්‍රධාන නගර තුනක් මුල්කර ගෙන පාලනය වී ඇත. එළාර රජ අනුරාධපුරයේ රජ කරන අවධියේ කැලණියේ කැලණිතිස්ස රජුත්, මාගම කාවන්තිස්ස රජුත්, රජ කොට ඇත.

(c) Sumitha Publishers

කැලණිතිස්ස රජ පවුලේ ඇති වුණු ආරවුලක දී
රජතුමා දඬුවම් කළේ අහිංසක රහතන් වහන්සේ නමකට යි.
මේ ගැන කෝප වූ දෙවිවරු මුහුද ගොඩගලන්න සැලැස්වූහ.



(c) Sumitha Publishers